2024.08

# මීගමුව අධ්‍යාපන කලාපය

## කතෝලික ධර්මය

## 2024 දෙවන වාර පරීක්ෂණය

Learning Resource Center
R
De Mazenod College
Kandana

08 ශ්‍රේණිය  කාලය පැය 02

නම:..........................................................  පන්තිය :..........

### I කොටස

- අංක 01 සිට 20 දක්වා එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. ශුද්ධ වූ ලූක් තුමා තම ශුභාරංචියේ සංකේතය කර ගත්තේ කුමක් ද?
i. සිංහයා  ii. රාජාලියා  iii. මිනිසා  iv. ගවයා

02. ශුද්ධ වූ ලූක් තුමා සිය කෘතිය පිළිගන්වා ඇත්තේ කාට ද?
i. ජොහාන් තුමාට  ii. පාවුලු තුමාට  iii. තියෝපිලස් තුමාට  iv. මතෙව් තුමාට

03. යෙසායා දිවැසිවරයා සඳහන් කරන ආකාරයට වනාන්තරයේ මොරගසන හඬ කාගේ ද?
i. පාවුලු තුමාගේ  ii. මතෙව් තුමාගේ  iii. ස්තේපන් තුමාගේ  iv. ස්නාවක ජොහාන් තුමාගේ

04. ශුභාරංචි ග්‍රන්ථයක් රචනා කළ විජාතිකයා වූයේ කවු ද?
i. ශු ජොහාන් තුමා  ii. ශු මාක් තුමා  iii. ශු ලූක් තුමා  iv. ශු මතෙව් තුමා

05. ශුද්ධ වූ ලූක් ශුභාරංචියේ දෙවන වෙළුම ලෙස සැලකෙන කෘතිය වන්නේ?
i. පාවුලු සංදේශ  ii. ජොහාන් ශුභාරංචිය  iii. මාක් ශුභාරංචිය  iv. අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත

06. ස්නාවක ජොහාන් තුමාගේ දෙමාපියන් වන්නේ ?
i. ආනා තුමිය හා ජුවකීනු මුනිතුමා  ii. සලෝමි හා සෙබදි
iii. මාර්තා හා ලාසරස්  iv. එළිසබෙත් තුමිය හා සෙකරියස් තුමා

07. ජේසුස් වහන්සේ පිළිගැනීම සඳහා ජනතාව සූදානම් කිරීමේ වගකීම පැවරුණේ කා හට ද?
i. පාවුලු තුමාට  ii. ලාසරස් ට  iii. පේදුරු තුමාට  iv. ස්නාවක ජොහාන් තුමාට

08. දේව මාතාවන්ට මංගලම් කී දේව දූතයා වන්නේ කවු ද?
i. රෆායෙල්  ii. මිකායෙල්  iii. ගාබ්‍රියෙල්  iv නාතාන්

09. විමුක්තිදායකයාණන් හඳුනාගත් සිමියොන්ගේ ගීය සඳහන් වන ශුභාරංචි ග්‍රන්ථය වන්නේ;
i. ශුද්ධ වූ මාක් ශුභාරංචිය  ii. ශුද්ධ වූ ජොහාන් ශුභාරංචිය
iii. ශුද්ධ වූ ලූක් ශුභාරංචිය  iv ශුද්ධ වූ මතෙව් ශුභාරංචිය

10. එක්වරක් පමණක් ලබා ගත හැකි දේව ප්‍රසාද නිධානයක් වන්නේ කුමක් ද?
i. පාපොච්චාරණය  ii. අභිෂේචද්ධි ආලේපය  iii. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ  iv. රෝගීන්ගේ ආලේපය

11. ජේසුස් වහන්සේ සිදු කළා වූ ප්‍රාතිහාර්යය ගණන වන්නේ
i. 02 කි  ii. 04 කි  iii. 06 කි  iv 08 කි

12. රෝගීන් සුව කිරීම සම්බන්ධ ප්‍රාතිහාර්යයක් වන්නේ කුමක් ද?
i. සබත් දින කුදු ස්ත්‍රීය සුව කිරීම  ii. මාරුත දමනය
iii. ජායිරස්ගේ දුව උත්ථාන කිරීම  iv ලාසරස් නැගිටුවීම

13. ස්වර්ග රාජ්‍යයේ ඇති වටිනාකම පෙන්වා දෙන උපමාව කුමක් ද?
i. දැල පිළිබඳ උපමාව  ii. චපුරන්නා පිළිබඳ උපමාව
iii. මුතු ඇටය පිළිබඳ උපමාව  iv. නිධානය පිළිබඳ උපමාව

14. ජේසුස් වහන්සේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කළේ කවදා ද?
i. පෙන්තකොස්ත දින  ii. මහ සිකුරාදා  iii. මහ බ්‍රහස්පතින්දා  iv. පාස්කු ඉරුදින සවස

15. ශුද්ධාත්ම ඵලයක් වනුයේ මින් කුමක් ද?
i. පිරිසිදුකම  ii. දැනගැන්ම  iii. දේව භය  iv තේරුම් ගැනීම

16. දිව්‍ය සත්ප්‍රසාදයේ ලක්ෂණයක් වන්නේ ;
i. ආහාරයකි  ii. ගිවිසුමකි  iii. ප්‍රාණයකි  iv ස්වප්නයකි

17. දිව්‍ය සත්ප්‍රසාදයේ පූර්ව සලකුණක් වන්නේ ;
i. ආබෙල්ගේ පඬුර  ii. මුහුදේ දී මසුන් වැඩි කිරීමේ ප්‍රාතිහාර්ය
iii. රතු මුහුද තරණය  iv මන්නා භෝජනය

18. අභිෂේක ආලේපය නැමති දේව ප්‍රසාද නිධානය ලබා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකමක් වන්නේ ;
i. වයස අවුරුදු 16 සම්පූර්ණ කර තිබීම ii. දෙමාපියන් දෙදෙනාම කතෝලික වී
iii. ප්‍රසාද ස්නාපනය ලබා තිබීම iv දෙමාපියන් දේවස්ථානයේ විවාහ වී සිටීම

19. ශුද්ධාත්ම දීමනාවක් වන්නේ මින් කුමක් ද?
i. කරුණාව ii. ස්නේහය iii. තේරුම් ගැනීම iv ප්‍රීතිය

20. ශුද්ධාත්ම දානය සිදුවූයේ කවදා ද?
i. ආලේලූයියා සෙනසුරාදා දින ii. පාස්කු ඉරුදින සවස iii. පෙන්තකොස්ත දින iv නත්තල් දින

( ලකුණු 02x15= 30)

## II කොටස 8 ශ්‍රේණිය

❖ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
❖ පළමු ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.

**01. කෙටි පිළිතුරු ලියන්න.**

i. ශුද්ධ බයිබලයේ ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.
ii. පුරාණ ගිවිසුමේ පංච පුස්තකයට අයත් පොත් දෙකක් නම් කරන්න.
iii. අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොතෙහි කතුවරයා කවුරුන් ද?
iv. සමදර්ශක ශුභාරංචි 02 ක් නම් කරන්න.
v. ශුද්ධ වූ ලූක් ශුභාරංචිය හඳුන්වනු ලබන නම් දෙකක් ලියන්න.
vi. ශුද්ධ වූ ලූක් තුමා විසින් රචිත නව ගිවිසුම තුළ දක්නට ලැබෙන පොත් දෙක නම් කරන්න.
vii. ජේසුස් වහන්සේගේ වංශාවලිය ඉදිරිපත් කිරීමෙන් සිය ශුභාරංචි ග්‍රන්ථය ආරම්භ කරන ශුභාරංචි කතුවරයා නම් කරන්න.
viii. දේව රාජ්‍යය තුළ දැකිය හැකි චරිතාකම් පිළිඳව ජේසුස් වහන්සේ ඉගැන් වූ උපමා දෙකක් නම් කරන්න.
ix. අභිෂේක ආලේපය දානය කරනු ලබන්නේ කවුරුන් විසින් ද?
x. ප්‍රසාද ස්නාපන පොරොන්දු අලුත් කරන අවස්ථාවක් ලියන්න. ( ලකුණු 02x10= 20)

02.
i. ශුද්ධ වූ ලූක් ශුභාරංචියේ ආරම්භක සිදුවීම කුමක් ද?
ii. ශුද්ධ වූ ලූක් ශුභාරංචිය "යාච්ඤාවේ ශුභාරංචිය" ලෙස නම් කිරීමට හේතු වූ උදාහරණ 03 ක් ලියන්න.
iii. ශුද්ධ වූ ලූක් ශුභාරංචියේ සැකැස්ම කරුණු 05 කින් ලියන්න. ( ලකුණු 2+3+5=10)

03.
i. ශුද්ධ වූ ලූක් ශුභාරංචියේ පරමාර්ථය කුමක් ද?
ii. ශුද්ධ වූ ලූක් ශුභාරංචියේ අඩංගු පණිවිඩ 03 ක් ලියන්න.
iii. ශුද්ධ වූ ලූක් ශුභාරංචිය මගින් ඔබගේ ජීවිතයට ගත හැකි ආදර්ශ 05 ක් ලියන්න. ලකුණු 2351O*

04.
i. ජේසුස් වහන්සේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කලේ කවදා ද?
ii. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ පිළිබඳ පූර්ව සලකුණු 03 ක් නම් කරන්න.
iii. දිව්‍ය සත්ප්‍රසාදයේ ලක්ෂණ 05 ක් ලියන්න. ( ලකුණු 2+3+5=10)

05.
i. ජේසුස් වහන්සේ තමන් වහන්සේගේ ප්‍රසිද්ධ ජීවිතය ආරම්භ කළේ කුමන ප්‍රදේශයකින් ද?
ii. ගලීල මුහුද අවට පිහිටි නගර තුනක් නම් කරන්න.
iii. ජේසුස් වහන්සේගේ ළමා විය පිළිබඳ වැදගත් කරුණු 05 ක් ලියන්න. ( ලකුණු 2+3+5=10)

06.
i. ශුද්ධ වූ ලූක් තුමා රචනා කළ කෘතීන් 02 නම් කරන්න.
ii. ශුද්ධ වූ ලූක් ශුභාරංචියේ සඳහන් වන උපමා කතා 03 ක් නම් කරන්න.
iii. පාසල් සිසුවෙකු ලෙස ශුභාරංචියේ සාක්ෂිකරුවෙකු වන්නේ කෙසේ දැයි කරුණු 05 කින් ලියා දක්වන්න.
( ලකුණු 2+3+5=10)

07. පහත මාතෘකා 02 ක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.
ගලීල මුහුද ස්නාවක ජොහාන් තුමා ශු ලූක් ශුභාරංචිය අභිෂේක ආලේපය
( ලකුණු 2 x 5=10)



REGISTRAR
De Mazenod College
Kandana.